# මහජනතාව වෙත කරන දැනුම්දීමයි

## නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වීම හේතුවෙන් කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රය අවලංගු කිරීම

බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ඒකාබද්ධ කිරීමේ සැලැස්මේ කොටසක් ලෙස කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්, නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී සමඟ ඒකාබද්ධ වීම හේතුවෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර ඇති බලපත්‍රය, 2023.07.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කළ බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත යටතේ කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් වෙත නිකුත් කර තිබූ ලියාපදිංචිය බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් 2023.07.31 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලදී.

**අධ්‍යක්ෂ / බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01
දුරකථන අංක : 0112477000, 0112440330, 0112330220
විද්‍යුත් තැපෑල: dsnbfi@cbsl.lk වෙබ් : http://www.cbsl.gov.lk